සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2023 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2023-08-19
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.6** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 අද්මිරාල්ති (admiralty) නඩු සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තේ කුමන අධිකරණයට ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය. (2) මහාධිකරණය.

(3) දිස්ත්‍රික් අධිකරණය. (4) මහේස්ත්‍රාත් අධිකරණය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) ශ්‍රී ලංකාවේ නීතියේ උත්තරීතර මූලාශ්‍රය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ.

(2) උඩරට නීතිය ප්‍රාදේශීය පදනමක් සහිත පුද්ගල නීතියක් වේ.

(3) ශ්‍රී ලංකාවේ ශේෂ නීතිය, ඉංග්‍රීසි නීතිය වේ.

(4) ශ්‍රී ලංකාවේ පොදුවේ ක්‍රියාත්මක වන නීතිය, රෝම ලන්දේසි නීතිය වේ.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතලයක් **නොවන්නේ** කුමක් ද?

(1) මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය.

(2) අවසාන සිවිල් හා අපරාධ පිළිබඳ අභියාචන බලය.

(3) පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම සම්බන්ධ අධිකරණ බලය.

(4) සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාරකාර අරමුදලේ (ETF) හිඟ මුදල් අයකර ගැනීම.

**1.4** ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ ඔබ වෙත ලබාදී ඇත:

**(a)** රක්ෂණ සහතිකය යනු CIF ගිවිසුමක් යටතේ ගැනුම්කරු විසින් විකුණුම්කරුට ඉදිරිපත්කළ යුතු ලියවිල්ලකි.

**(b)** ණයවර ලිපිය යනු ජාත්‍යන්තර වෙළඳාමේ ගෙවීම් සඳහා භාවිත කරනු ලබන ක්‍රමයකි.

**(c)** සමථකරණය යනු අධිකරණමය නොවන ආරවුල් විසඳීමේ ක්‍රමයකි.

ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ, ඉහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

(1) **(a)** සහ **(b)** පමණි.
(2) **(a)** සහ **(c)** පමණි.
(3) **(b)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** විනිමය බිල්පතක් පිටසන් කිරීමට අදාලව පහත සඳහන් උදාහරණය ඔබට දී ඇත:

**ඒ. සමන් කුමාර**

ඉහත සඳහන් විනිමය බිල්පතේ පිටසන් කිරීම වන්නේ:

(1) හිස් පිටසනයි.
(2) විශේෂ පිටසනයි.
(3) සීමාකාරී පිටසනයි.
(4) කොන්දේසි සහිත පිටසනයි.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනුකරුවෙකු විසින් අණ කෙරුනු චෙක්පතක් සඳහා ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට / අගරු කිරීමට බැංකුවට ඇති බලය / අධිකාරිය ඇත්තේ කුමන අවස්ථාවේ ද?

(1) ගනුදෙනුකරුගේ මරණය පිළිබඳ දැනුවත් වීමෙන්.
(2) පසුදාතම (postdated) චෙක්පතක් වන විට.
(3) චෙක්පත කල් ඉකුත්ව ඇති විට.
(4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමග, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** භාණ්ඩ නශ්‍ය වන ස්වරූපයේ (perishable in nature) භාණ්ඩ වන විටෙක, මිල නොලත් විකුණුම්කරුට එම භාණ්ඩ නැවත විකිණීමේ අයිතිය හිමි වේ.

**1.8** නැව තෙක් නොමිලේ [Free on Board (FOB)] ගිවිසුමකදී, ගිවිසුමට අනුව, භාණ්ඩවල ගිවිසුම්ගත වූ ගමනාන්තය දක්වා ප්‍රවාහනය කිරීම පිණිස ප්‍රවාහන ගිවිසුමකට ඇතුළත් වීමට විකුණුම්කරු වගකීමට බැඳේ.

**1.9** 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අරමුණ වන්නේ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්ථවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීම හා එවැනි ගනුදෙනු අනාවරණය කර ගැනීම වේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමග, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** විනිමය බිල්පත් ආඥා පනතට අනුව, බිල්පතෙහි යථාකාලීන දරන්නාගේ (holder in due course) අයිතිවාසිකම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.11** නෞභාර පත්‍රයක ඇතුළත් කළ යුතු කරුණු දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** "ගනුදෙනු කළ නොහැකි උපකරණ" සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** භාණ්ඩ විකිණීමේ ගිවිසුමක, ප්‍රතිප්ඨාව (මිල) තීරණය කරනු ලබන ආකාර (methods) දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව "භාණ්ඩවලට" එරෙහිව තිබෙන ප්‍රතිකර්ම (remedies) දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

**වලිමුණී** ඔහුගේ සේවා ස්ථානයේ වෘත්තීය සමිති නායකයා වේ. **වලිමුණී** විසින් **සීමාසහිත XYZ ඉන්ෂුවරන්ස් සමාගමෙන්** ජීවිත රක්ෂණ ඔප්පුවක් අයදුම්කරන ලදී. මේ සඳහා වන වෛද්‍ය පරීක්ෂණයේදී ඔහු පසුගිය වසර පහ තුළදී ඇදුම රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ලබාගෙන ඇත්දැයි විමසන ලදී. **වලිමුණීගේ** පිළිතුර වූයේ "නැත" යන්නයි. එසේවුවද, ඔහු ඇදුම රෝගය සඳහා වෛද්‍යවරයෙකු හමුවී ඇති අතර, නිතිපතා භාවිතය සඳහා ඉන්හේලර් (inhalers) දෙකක්ද නිර්දේශකොට ඇත. රක්ෂණ ඔප්පුව ලබාගැනීමෙන් පසු **වලිමුණීගේ** වෘත්තීය සමිතිය විසින් සංවිධානය කළ දැවැන්ත විරෝධතාවයක් අතරතුර සිදුවූ කඳුලු ගෑස් ප්‍රහාරය හේතුවෙන් **වලිමුණීට** දරුණු බලපෑම් ඇතිවූ අතර, ඔහුගේ පෙනහළුවලට සිදුවූ හානිය සහ ඇදුම රෝගය හේතුවෙන් මරණයට පත්විය. පශ්චාත් මරණ පරීක්ෂණයේදී හඳුනාගෙන ඇත්තේ දුර්වල පෙනහළු නිසා හටගත් ඇදුම රෝගයෙන් ඔහු මරණයට පත්වී ඇති බවය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත XYZ ඉන්ෂුවරන්ස් සමාගම** වෙතින් ලබාගත් ජීවිත රක්ෂණ ආවරණය යටතේ **වලිමුණීගේ** බිරිඳට වන්දි ඉල්ලා සිටිය හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) රක්ෂණ ගිවිසුමක පාර්ශවයන් (parties) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**රෝසි** 2018 අප්‍රේල් 01 දින රු.60,000/- ක වැටුපකට සීමාසහිත පෞද්ගලික සමාගමක් හා සම්බන්ධ විය. සමාගමේ සේවකයෙකු වශයෙන් ඇයට සේවක අර්ථසාධක අරමුදලට [Employees' Provident Fund (EPF)] සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට [Employees' Trust Fund (ETF)] හිමිකම් ඇත. වෙනත් රටක ස්ථිර පදිංචිය පිණිස සංක්‍රමණය වීම සඳහා 2023 අප්‍රේල් 30 දින සිට බලපැවැත්වෙන පරිදි ඇය විසින් සිය ඉල්ලා අස්වීමේ ලිපිය ඉදිරිපත්කොට ඇත. ඇයගේ අවසාන මස වැටුප රු.200,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉල්ලා අස්වන අවස්ථාවේ, **රෝසිගේ** පාරිතෝෂික හිමිකම (gratuity) **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) සේවක අර්ථසාධක අරමුදල (EPF) ආපසු ලබාගැනීම සඳහා **රෝසිට** ඇති අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) 1980 අංක 46 දරණ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් (ETF) පනතේ ප්‍රධාන කාර්යයන් (main functions) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**සුරේෂ්,** 2019 දී "හොඳ යාළුවෝ" නමින් පොතක් රචනාකොට එහි ප්‍රකාශන අයිතිය ලබාගන්නා ලදි. ඔහු විසින් **තිමල්** හට මෙම පොත පරිවර්තනය කිරීම සඳහා අවසර ලබාදී තිබුණි. එසේ තිබියදී, 2020 දී **සුරේෂ්** ජීවිතක්ෂයට පත්විය. පරිවර්තනය අවසානයේදී **තිමල්** විසින් මෙම පොත වෙනත් නමක් යටතේ ඔහුගේ පොතක් ලෙස පළකොට තිබුණි. **සුරේෂ්ගේ** බිරිඳ **තිමල්** ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැළසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශ්‍රී ලංකාවේ පවතින ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ **සුරේෂ්ගේ** බිරිඳට ඇති නීතිමය අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

"හවුල් ව්‍යාපාර ස්ථාපනය, සෑම ව්‍යාපාර නීති ක්ෂේත්‍රයක් තුළම වඩාත්ම නඩු පැවරීමකට භාජනය වූ ප්‍රශ්නයක් විය. එනමුත් වර්තමානයේදී එයට ලැබී ඇත්තේ ඉතා සුළු න්‍යායාත්මක අවධානයක් පමණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් හවුල් ව්‍යාපාර ස්ථාපනයට අදාල ගැටළු විශ්ලේෂණය සාපේක්ෂ වශයෙන් පරීක්ෂා නොකළ සංකල්පීය උපකල්පන මඟින් පාලනය වේ."

*Bayern, S. (2015). Three Problems (and Two Solutions) in the Law of Partnership Formation. U. Mich. JL Reform, 49, 605. at p605.*

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව, හවුල් ව්‍යාපාරයක් හඳුනාගත හැකි මූලිකාංග (elements) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකුට ලැබී ඇති ව්‍යංග බලතල / අධිකාරී (implied authorities) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සරත්** කුකුළු ගොවිපොළක සහ බිත්තර තොග ව්‍යාපාරයක හිමිකරුවෙකි. ඔහු විසින් තම ව්‍යාපාරය ලාභ සහිතව කළමනාකරණය කර පවත්වාගෙන යාමට **කපිලට** අවසර දී ඇත. ඔවුන්ගේ ගිවිසුමේ කොටසක් ලෙස **කපිල** විසින් කිසිම හේතුවක් මත බිත්තරයක් රු.55/- කට අඩුවෙන් විකිණිය නොහැකි ලෙස උපදෙස් ලබාදී ඇත. හදිසියේ ඇතිවන කුකුල් ආහාර සැපයුම් සම්බන්ධයෙන් මෙම ගිවිසුමේ කිසිවක් සඳහන්කොට නොමැත. කෙසේවුවද, කුකුලන්ට දෙන ආහාර තොගවල හදිසි හිඟයක් ඇතිවූ බැවින්, **කපිල** විසින් **මොහමඩ්ගෙන්** කුකුලන්ට දෙන ආහාර ණයට මිලදී ගන්නා ලදී. මේ අතර, **කපිල** විසින් බිත්තර 1,000 ක් එකක් රු.52/- බැගින් **රාජා** ට අලෙවිකරන ලද අතර, මෙයින් විශාල ප්‍රමාණයක් හොඳ තත්ත්වයේ බිත්තර නොවන බව **රාජා** ට පසුව අවබෝධ විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සරත්** සහ **කපිල** අතර ඇති නියෝජ්‍යත්ව සම්බන්ධතාවයේ ස්වභාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) **කපිල** විසින් ණයට මිලදී ගත් කුකුලන්ට දෙන ආහාර සඳහා **මොහමඩ්** ට ගෙවීම් කිරීම සඳහා **සරත්** වගකීමට බැඳේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) **රාජා** ට **සරත්ගෙන්** වන්දි ඉල්ලිය හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) **අප්සාරි,** ඇයගේ උපන් ගම වන බදුල්ල ප්‍රදේශයේ **සීමාසහිත AAA සමාගම** යනුවෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඇගේ එම සමාගම විසින් ශ්‍රී ලංකාවේ ස්වදේශික කහ භාවිත කරමින් සම්ප්‍රදායික රූපලාවන්‍ය ආලේපන වර්ගයක් වන **"වර්මරිකා"** නිෂ්පාදනය කරනු ලබන අතර, එය ශරීර ආලේපනයේදී මූලික යෙදුමක් (foundation) ලෙස භාවිත කළ හැකිය. ජනවාරි 08 දින, **අප්සාරි** විසින් හොරණ ප්‍රදේශයේ පදිංචි **කහතුඩුව** නමැති කහ සැපයුම්කරුට කතා කොට ස්වදේශීය කහ කිලෝග්‍රෑම් 500 ක්, කිලෝග්‍රෑමයක් රු.5,000/- ක මිලකට ලබාගැනීම සඳහා අර්පණයක් ඉදිරිපත් කළ අතර, එම අර්පණය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම තැපැල් මාර්ගයෙන් බදුල්ලේ ලිපිනයේ පිහිටි කාර්යාලයට ඔහු විසින් දැනුම් දීම **අප්සාරි** ට අවශ්‍ය විය. ජනවාරි 10 දා උදෑසන **කහතුඩුව** විසින් ප්‍රකාශිත කහ තොගය සඳහන් කරන ලද මිල යටතේ සැපයීමට ඔහු සූදානම් බව ප්‍රකාශ කරමින් **අප්සාරි** වෙත, ලිපියක් තැපැල් කරන ලදී. මෙම ලිපිය ජනවාරි 13 දා **අප්සාරිගේ** කාර්යාලයට ලැබුණි. මේ අතරතුර **අප්සාරිගේ** අර්පණය පිළිබඳ දැනගත් තවත් කහ සැපයුම්කරුවෙකු වන **අලී,** මෙම අර්පණය පිළිගැනීමට තීරණය කරන ලදී. ජනවාරි 10 දින සවස, **අලී** විසින් **අප්සාරි** මුණ ගැසුනු අතර, ඇය විසින් කහ කිලෝග්‍රෑම් 500 ක් කිලෝග්‍රෑමයක් රු.4,500/- කට මිලදී ගැනීමට අදාල ගිවිසුම **අලී** ට අර්පණය කළ අතර, **අලී** විසින් එය පිළිගෙන, **අප්සාරිගේ** කාර්යාලයට අදාල කහ තොගය බෙදාහරින ලදී. **අප්සාරි** විසින් **අලී** සමඟ ඇතිකරගත් ගිවිසුම හෙළිදරව් කර, **කහතුඩුවගේ** කහ ප්‍රතික්ෂේප කරන ලදී. මේවන විට **කහතුඩුව** විසින් **අප්සාරි** ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සැළසුම් කරමින් සිටී.

මැතකදී, **අප්සාරිගේ** නිෂ්පාදිතයක් වන **"ටර්මරිකා"** හි සාරය පින්තාරු කිරීමේ වර්ණයක් ලෙස භාවිත කළ හැකි බව ඇය විසින් සොයාගත් අතර, මෙම අතුරු නිෂ්පාදිතය **"කහ-ආලේප"** ලෙස නම් කරන ලදී. **අප්සාරි** විසින් මෙම අතුරු නිෂ්පාදිතය පහත පැහැදිලි කිරීම් සහිතව පුවත්පතක ප්‍රචාරය කරන ලදී,

*"**කහ-ආලේප**' භාවිතය නිසා වන අලාභ වෙනුවෙන් වන්දි ඉල්ලුම් කරන ඕනෑම පුද්ගලයෙකුට **අප්සාරි** විසින් රු.100,000/- ක ත්‍යාගයක් පිරිනමනු ලැබේ. කරුණාකර දී ඇති උපදෙස් අනුගමනය කරන්න"*

බිතු සිතුවම් සංරක්ෂණය කරනු ලබන චිත්‍ර ශිල්පියෙකු වන **සිත්තර ගුරුන්නාන්සේ** විසින් මහනුවර පන්සලක ඇති ඉපැරණි බිතු සිතුවම් සංරක්ෂණය වෙනුවෙන් වූ ලංසුවක් (bid) ජයග්‍රහණය කරන ලදී. ඔහු විසින් **සීමාසහිත AAA සමාගමෙන්, "*කහ-ආලේප*"** මිලට ගෙන **සීමාසහිත AAA සමාගම** විසින් නියම කර ඇති ක්‍රමවේදයන්ට අනුව එය පන්සලේ ඇති බිතු සිතුවම් සංරක්ෂණ කටයුතු සඳහා භාවිතකරන ලදී. වර්ණ ආලේපනයෙන් සතියක් තුළ ඉපැරණි බිතු සිතුවම් සම්පූර්ණයෙන්ම විනාශයට පත්විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **අප්සාරි** විසින් **කහතුඩුව** ට ලබාදෙන ලද දුරකතන ඇමතුම මගින් වලංගු අර්පණයක් සිදුවේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) **අප්සාරි** ට එරෙහිව **කහතුඩුව** ට නීතිමය ක්‍රියාමාර්ග ගතහැකිද යන්න **විමසන්න**. (ලකුණු 06)

(c) **අප්සාරි** ට එරෙහිව **සිත්තර ගුරුන්නාන්සේ** ට නීතිමය ක්‍රියාමාර්ග ගතහැකිද යන්න **විමසන්න**. (ලකුණු 06)

(B) ශ්‍රී ලංකාවේ අසාමාන්‍ය ලෙස බිත්තර මිල ගණන් ඉහළ යාමට විසඳුමක් ලෙස බිත්තර ආනයනය කිරීමට රජය තීරණය කරන ලදී. **සීමාසහිත Uttara-Bittara සමාගම,** යනු ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ බිත්තර තොග විකුණුම් සමාගමකි. ආනයනික බිත්තර සැපයීම සඳහා සුපිරි වෙළෙඳසැලක් වන **K-Super** වෙතින් **සීමාසහිත Uttara-Bittara සමාගම** වෙත ඇණවුමක් ලැබී ඇත. ඇණවුම ලබාදීමට ප්‍රථමයෙන් **K-Super** හි කළමනාකරු **සීමාසහිත Uttara-Bittara සමාගමට** ගොස් ආනයනික බිත්තර නියැදියක් පරීක්ෂා කරන ලදී. පසුව **සීමාසහිත Uttara-Bittara සමාගම,** තමන් සතු බිත්තර තොගයෙන් 10,000 ක් "*ඉන්දියාවෙන් ආනයනය කරන ලදී*" යනුවෙන් සඳහන් කරමින් **K-Super** වෙත සපයන ලදී. එකඟ වූ බිත්තර 10,000 ක තොගය බෙදාහැරීමෙන් පසු, එයින් බිත්තර 6,000 ක තොගයක් පමණක් නියැදියට අනුකූල බවත්, ඉතිරිය ඉන්දියාවෙන් ආනයනය නොකළ ඒවා බවත්, **K-Super** හි ගබඩා භාරකරු විසින් හඳුනාගන්නා ලදී.

සිදුවූ අලාභය වෙනුවෙන් **සීමාසහිත Uttara-Bittara සමාගම** ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මේ වනවිට **K-Super** සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **K-Super** හට සිදුවූ අලාභය වෙනුවෙන් **සීමාසහිත Uttara-Bittara සමාගම** වෙතින් වන්දියක් ලබාගත හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) විකුණුම්කරු සහ ගැනුම්කරු අතර නිශ්චිත භාණ්ඩ යටතේ දේපලක අයිතිය මාරු වීමට අදාළ රීතීන් (rules) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණු සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |